2

# සිංහල ශිලාලේඛනගත කෘෂි වාක්කෝෂය පිළිබඳ සමාජවාග්විද්‍යාත්මක (Sociolinguistics) අධ්‍යයනයක්

*(තෝරාගත් ශිලාලේඛන ආශ්‍රයෙන්)*

**කිත්සිරි මිහිර බණ්ඩාර**


## Abstract

The scope of linguistics is to study of human language and Sociolinguistics, a branch of modern linguistics is the study of language in relation to the society.The sociolinguists emphasis that there is an inseparable relationship betweena society and its language and also these two are inter- dependable. As a result of this, the socio-cultuaral facts such as age, gender, class, occupation, education and ethnicity directly effect for all components of a language, so the varieties and changes of phonetics, phonology, morphology, syntax and semantics can be don by so called facts.Thus, Present study has attempted to examine the vocabulary of Sinhalese inscriptions from 3$^{rd}$ BC to the end of 12$^{th}$ century AD under the research problem of What is the Sociolinguistic Interrelationship between Vocabulary Related to Agriculture and Socio-cultural Facts?.As primary sources, inscriptios are strong enough to provide many valuable and rare facts for filing the research gaps related to humanities and social sciences.If there are a good number of valuable research works on Sinhalese inscriptions and its language,it vary rare to find out a good research on Sinhalese inscriptional language according to theories of sociolinguistics. Therefore, the aim of this research was to reveal the inter-relationship between agricultural-vocabulary on Sinhalese inscriptions and socio-cultural conditions of speech communities in ancient Sri Lanka. Using a literary survey for collecting secondary data and applying a qualitative method in this research, it could reveal that socio-economy and cultural facts have directly effected the vocabulary of Sinhalese inscriptions.


Keywords: **Agricultural-vocabulary, Inscription, Language, Sociolinguistics, Speech community.**

## 1. ප්‍රවේශය

මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා විෂයක්ෂේත්‍රාබද්ධ මූලාශ්‍රය ප්‍රවර්ග අතර අභිලේඛනවලට හිමිවන්නේ විශේෂත්වයකි. ඉපැරණි දැනුම, ඥානය හා පරිචය ප්‍රතිස්ථාපනය කිරීමෙහිලා වඩාත් ශක්තිමත්, විශ්වසනීය හා නිරවද්‍ය මූලාශ්‍රයීය වටිනාකම් සහිත සාධක අභිලේඛන විසින් සම්පාදනය කෙරෙයි. අභිලේඛනවල අනුප්‍රවර්ගයක් වන ශිලාලේඛන යනු යථෝක්ත වටිනාකම් සහිත වඩාත් ජනප්‍රිය හා බහුපරිශීලිත මූලාශ්‍රය ප්‍රභේදයක් ලෙස සතතාවධානයට ලක්වෙයි. බොහෝ පෙර’පර දෙදිග සමාජ-සංස්කෘතිවල සාඩම්බර හා ප්‍රෞඪ උරුමයක් ලෙස සැලකෙන ශිලාලේඛන විසින් තත් සමාජ සංස්කෘතිවල අතීතානන්‍යතා සංරක්ෂණයෙහිලා ඉටුකෙරෙන දායකත්වය අනුපමේය බැව් හඳුනාගත හැකිය. බහුපර්ෂද් පිළිගැනීම් අනුව ලාංකේය සෙල්ලිපිකරණය ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස තරම් අතිදීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියයි. සෙසු මූලාශ්‍රයවලට සාපේක්ෂව ශ්‍රී ලාංකේය අතීත තත්ත්වලක්ෂණ පිළිබඳ පවතින දැනුම නිවැරදි කිරීම, තහවුරු කිරීම හා ඌනපූරණය කිරීම වෙනුවෙන්  ශිලාලේඛනවල දායකත්වය අතිවිශේෂ වෙයි. සංඛ්‍යාත්මකව විශාල අගයක් සහිත සිංහල ශිලාලේඛන මගින් විවිධ ක්ෂේත්‍රාබද්ධ අතීත තත්ත්වලක්ෂණ ගවේෂණය කිරීමෙහි සුගම පර්යේෂණාවකාස සකසා ගත හැකිය. විවිධ කාලාවධිවල දේශපාලන ස්වභාවය, ආර්ථික තත්ත්වය, සමාජ-සංස්කෘතික හා ආගමික ස්වභාවය මෙන්ම භාෂා ලක්ෂණ ඒ අතර විශේෂ වෙයි. එබැවින් භාෂාධ්‍යයන ක්ෂේත්‍රයට අදාළව භාෂාවේ එක් ප්‍රමුඛ ඒකකයක් වන පද ප්‍රස්තරයක් ප්‍රස්තුත කරගනිමින් ‘සිංහල ශිලාලේඛනගත කෘෂි වාක්කෝෂයෙහි සමාජවාග්විද්‍යාත්මක සම්බන්ධතාව කවරාකාරද?’ යන පර්යේෂණ ගැටලුව මත මෙම පර්යේෂණය සිදුකෙරිණි.

## 2. විධික්‍රමය

මෙය නූතන වාග්විද්‍යාවේ එක් ප්‍රමුඛ අධ්‍යයන මානයක් වන සමාජවාග්විද්‍යා න්‍යායානුසාරීව සිංහල ශිලාලේඛන භාෂාවේ පද ප්‍රස්තරය පිළිබඳ කරන ලද පර්යේෂණයකි. ලාංකේය ශිලාලේඛන පිළිබඳ විවිධ විද්වතුන් විසින් සිදුකරන ලද පර්යේෂණ රාශියක් හමුවෙයි. විවිධ ප්‍රස්තුත ඔස්සේ ඒ ඒ පර්යේෂණ ගැටලුවලට විසඳුම්, නව සොයාගැනීම් හා නිගමන යෝජනා කරමින් සිදුකර ඇති එවැනි පර්යේෂණ  අතර ශිලාලේඛන භාෂාව පිළිබඳ කරන ලද විශිෂ්ට පර්යේෂණද

අනාවරණය කරගත හැකිය. සිංහල භාෂාවේ විකාශනය හෝ පරිණාමය හා යුගලක්ෂණ අධ්‍යයනය කිරීමේ ප්‍රබල සාධක සපයන ශිලාලේඛන පිළිබඳ බහුඅවධානයට ලක්වී ඇත්තේ ඓතිහාසික හා විග්‍රහාත්මක භාෂාධ්‍යයන ප්‍රවේශවලට සීමාවෙමිණි. සිංහල ශිලාලේඛන භාෂාව පිළිබඳ නූතන සමාජවාග්විද්‍යාත්මක ප්‍රවේශයකින් සිදුවූ ප්‍රාමාණික අධ්‍යයන හමුනොවෙයි. එබැවින් සිංහල ශිලාලේඛන භාෂාවේ අන්තර්ගත පදවල සමාජවාග්විද්‍යාත්මක පදනම මෙමගින් පර්යේෂණයට ලක්කෙරෙයි. ප්‍රස්තුත භාෂාවේ සමාජවාග්විද්‍යාත්මක පදනම් නිර්ණය කරනු වස් ඓතිහාසික හා විග්‍රහාත්මක වාග්විද්‍යාධ්‍යයන න්‍යායද ආශ්‍රය කෙරුණු මෙම පර්යේෂණය, තෝරාගත් සිංහල ශිලාලේඛනගත භාෂාවේ පද ප්‍රස්තරය කෙරෙහි පමණක් සීමා වූ අතර එයද කෘෂි ක්ෂේත්‍රයට අදාළ වාක්කෝෂය දක්වා පමණක් නැවත සීමා කෙරිණි. ඒ අනුව ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව, පුස්තකාලයීය පරිශීලනයෙන් සම්පාදිත දත්ත සමාජවාග්විද්‍යා න්‍යායානුගතව විශ්ලේෂණය කොට අර්ථකථනය කරමින් නිගමන කරා එලඹුණි.

## 3. භාෂා අධ්‍යයනයේ සමාජවාග්විද්‍යාත්මක ප්‍රවේශය

භාෂාධ්‍යයන ක්ෂේත්‍රයෙහිලා 20වන සියවසේ සිදු වූ නව ප්‍රවණතා කරණකොටගත් විද්‍යාත්මක සම්ප්‍රදානත් සමග එය වාග්විද්‍යාව (*Linguistics*) නමින් විද්‍යාත්මක අධ්‍යයන ක්ෂේත්‍රයක් බවට පත්විය. සියවස් ගණනක් තිස්සේ පෙර අපර දෙදිග දේශවල විවිධ විද්වතුන් විසින් මානව භාෂාව පිළිබඳ කරන ලද නොයෙක් අධ්‍යයනයන්හි කූඨප්‍රාප්තිය ලෙස සැලකෙන නූතන වාග්විද්‍යාවේ උද්භවය හේතුකොටගෙන මානව භාෂාව පිළිබඳ විවිධ දිශානතීන් ඔස්සේ පර්යේෂණය කිරීමේ අවකාස උදාවිය. මෙමගින් මිනිසා සමග සම්බන්ධ සෑම ක්ෂේත්‍රයක් ඔස්සේම වාග්විද්‍යාවේ විවිධ අනුශාඛා බිහිවිය. සමාජවාග්විද්‍යාව (*Sociolinguistics)* ලෙස භාෂාව පිළිබඳ වෙනම අධ්‍යයන මානයක් බිහිවන්නේද යථෝක්ත ප්‍රවණතාවෙහි ප්‍රතිඵලයක් වශයෙනි. භාෂාවේ සංස්ථිතිය කෙරෙහි ප්‍රමුඛාවධානය යොමු කරමින් වාග්විද්‍යාධ්‍යයන මෙතෙක් ජනප්‍රියව පැවතියේ ඓතිහාසික, තුලනාත්මක හා විග්‍රහාත්මක න්‍යායික එළඹුම්වලට පමණක් සීමාවෙමිනි. එහෙත් සමාජවාග්විද්‍යාවේ උද්භවයත් සමග යථෝක්ත අධ්‍යයන දිශානතීන් අතිව්‍යාප්ත විය. 'භාෂාව සමාජ ප්‍රපංචයක් වශයෙන් සමාජ-සංස්කෘති හා වටිනාකම් පද්ධති සමග අත්‍යන්තයෙන් සම්බද්ධව ඇති ආකාරය අනාවරණය කිරීමට සමාජවාග්විද්‍යාව නම් මෙම නව

ප්‍රවණතාව මගින් යත්න දැරෙයි. *(Trudgill, 2000;8*) මෙය භාෂාධ්‍යයනයෙහි විශේෂ පියවරක් ලෙස හඳුන්වාදිය හැකිය. භාෂාවට සමාජ බලපෑමක් කළ හැකි බව හා භාෂාව අයත් තත් සමාජය පාලනයට භාෂාවම මෙවලමක් ලෙස භාවිත කළ හැකි ආකාරය සමාජවාග්විද්‍යා පර්යේෂණ මගින් අනාවරණය වීම මෙම පර්යේෂණ මානයෙහි විශේෂතාවකි.

සමාජවාග්විද්‍යාව භාෂාධ්‍යයනයෙහි අභිනව විද්‍යාත්මක ශික්ෂණයක් ලෙස හඳුන්වාදීමේ හා ප්‍රවර්ධනය කිරීමේ පරෝගාමියා ලෙස සැලකෙන්නේ ඇමෙරිකානු ජාතික විලියම් ලැබොව් *(William Labov)* ය. *'Socio + linguistic'* දෙපදයේ සන්ධියෙන් සැකසී ඇති '*Sociolinguistic*'යන ඉංග්‍රීසි පදය විසින් විෂයාබද්ධව දෙනු ලබන අර්ථය 'සමාජ-සංස්කෘතික දෘෂ්ටියෙන් භාෂාධ්‍යයනය කෙරෙන විෂයක්ෂේත්‍රය' *(Crystal,2008;440)* බවයි. මෙහි *'Socio'* යන්නෙන් සමාජ-සංස්කෘතිකාබද්ධ සාධකත් *'linguistic'* යන්නෙන් මානව භාෂාව විද්‍යාත්මකව අධ්‍යයනය කෙරෙන විෂයක්ෂේත්‍රය වශයෙනුත් අර්ථවත් කෙරෙයි. ආර්. ඒ. හඩ්සන්ට *(R.A.Hudson)* අනුව 'සමාජවාග්විද්‍යාව යනු භාෂාවේ සමාජ සම්බන්ධතාව අධ්‍යයනය කිරීමයි. ආනුභවික හා න්‍යායාත්මක අධ්‍යයන ක්‍රමවේදයක් වන සමාජවාග්විද්‍යා පර්යේෂණ සමාජයත් භාෂාවත් අතර පවතින සංකීර්ණ අත්‍යන්ත සම්බන්ධතාව අධ්‍යයනය කෙරෙයි' *(Hudson, 2001;6).* 'සමාජවාග්විද්‍යාව යනු භාෂා සංස්ථිතිය හා සමාජ සංස්ථිතිය අතර සහසම්බන්ධතාව ගවේෂණයට දරනු ලබන උත්සාහයයි' *(Gumperz ,1971;223)*. වයස, ස්ත්‍රී-පුරුෂ භාවය, අධ්‍යාපනය, වෘත්තිය ආදී සාධක පදනම්කරගත් විවිධ සමාජ ස්තරත් වර්ගය, ජාතිය, කුලය, ආගම, ඇදහිලි-විශ්වාස මෙන්ම වටිනාකම්, අභිමතාර්ථ ආදී විවිධ සමාජ-සංස්කෘතික ප්‍රතිමානත් පූර්වෝක්ත සමාජ-සංස්කෘතික සාධක ගණයට අයත්වෙයි. සමාජවාග්විද්‍යාවේදී භාෂාවේ භාවිතයට ප්‍රමුඛතාව යොමුවෙන අතර එමගින් සමාජ-සංස්කෘතික හා භූගෝලීය සාධක පදනම්කොටගෙන භාෂාවේ භාවිතය විග්‍රහයට ලක්කරයි. සමාජවාග්විද්‍යාව සෙසු වාග්විද්‍යාධ්‍යයන අතර අනන්‍ය වන්නේ සමාජ-සංස්කෘතික දෘෂ්ටිය ප්‍රධාන මූලධර්මයක් ලෙස භාවිතකිරීම කරණකොටගෙනයි. සාපේක්ෂව සමාජවාග්විද්‍යාධ්‍යයන ක්ෂේත්‍රය පෘථුල හා සංකීර්ණ වුවද මානව භාෂාව සතු සමාජ-සංස්කෘතික විවිධතා හා විශේෂතා විෂයාන්තර්ගත බැවින් එය වඩාත් ජනප්‍රිය විෂයක් බවට පත්වී ඇත.

සෙසු වාග්විද්‍යානුශාඛාවල මෙන්ම සමාජවාග්විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයද මානව භාෂාවය. 'භාෂාව' යනු කුමක්දැයි අර්ථකථනය කිරීමේ පටන් පොදුවේ මානව භාෂව මෙන්ම ඕනෑම ප්‍රස්තුත භාෂාවක භාෂානුප්‍රස්තර, භාෂාවේ විවිධතා, පරිණාමය හා පරිණාම සාධක ආදිය, සමාජ-සංස්කෘතික සාධක පදනම්කොටගත් ප්‍රවේශයකින් අධ්‍යයනය කිරීම සමාජවාග්විද්‍යාවේ විෂයාන්තර්ගතයි. හඩ්සන්, පීටර් ටෲඩ්ගිල් ආදී ප්‍රාරම්භක හා පශ්චාත්තන සමාජවාග්විද්‍යාඥයින්ට අනුව සමාජයෙන් භාෂාවත් භාෂාවෙන් සමාජයත් වෙන්කොට සාකච්ඡාකළ නොහැකිය. භාෂාවෙන් තොර සමාජ පැවැත්මක් සහ සමාජයෙන් වියුක්තව භාෂාවේ ස්ථිතියත් නිශ්චිත නොවන බව මෙවුන්ගේ තර්කයයි. මෙම දෙඅංශය අන්‍යෝන්‍යව සම්බද්ධ මෙන්ම බලපෑම් සහගතද වෙයි. එබැවින් සමාජවාග්විද්‍යාවේදී ප්‍රමුඛාවධානය යොමු කෙරෙන්නේ භාෂක සමාජය *(Speech community)* කෙරෙහිය. භාෂක සමාජය ප්‍රමුඛ මූලය හෙවත් සාධකය කොටගෙන භාෂාව පර්යේෂණය කිරීම සමාජවාග්විද්‍යාවේ විධික්‍රමයයි. ඒ අනුව සිංහල ශිලාලේඛන භාෂක සමාජය ප්‍රස්තුත කරගනිමින් තත් භාෂාවේ පද ප්‍රස්තරය මෙම අධ්‍යයනය මගින් පර්යේෂණය කෙරිණි.

## 4. සිංහල ශිලාලේඛන භාෂක සමාජය හා භාෂාව

පුරාණයේ පටන් ලාංකේය ලේඛන කාර්යය සඳහා මාධ්‍යය වශයෙන් තෝරාගත් අමුද්‍රව්‍ය රැසක් පිළිබඳ සාධක හමුවෙයි. බුරජ පොතු, කපු රෙදි, දැව පුවරු, උණ පතුරු, සත්ත්ව හම්,ඇත් දත් පුවරු, ලෝහ තහඩු, ගඩොල්, වළං මෙන්ම පුස් කොළ හා ශිලා පුවරු ද කලින් කල ජනප්‍රිය ලේඛන අමු ද්‍රව්‍ය ලෙස භාවිත වී ඇත. මේ අතරින් ශිලා පුවරු වර්තමානයේද අවධානයට ලක්වෙන විශේෂ ලේඛන මාධ්‍යයකි. ලාංකේය ලේඛන සම්ප්‍රදාය ආරම්භය සනිටුහන් කරන සාධක ලෙස දැනට අවිනෂ්ටව ඇති ලේඛන සඳහාද මාධ්‍යයක් වී ඇත්තේ ශිලා පුවරු බව හඳුනාගත හැකිය. කළුගල් ලේඛන අමුද්‍රව්‍යයක් ලෙස බොහෝ දෙනෙකු අභිරුචියෙන් පරිහරණය කළ ජනප්‍රිය ලේඛන මාධ්‍යයක් බව ක්‍රිස්තු පූර්ව යුගවල පටන් වර්තමානය දක්වා හමුවෙන විවිධ ශිලා ලේඛනවලින් පැහැදිලි වෙතත් ලාංකේය ශිලාලේඛනකරණයෙහි ආරම්භය කවදා? කෙසේ? සිදුවූයේදැයි නිශ්චිත නැත. ඒ අනුව සන්නිවේදන කාර්යය සඳහා ශිලාලේඛන භාවිත කරන ලද භාෂක සමාජයෙහි ආරම්භයද නිශ්චය කිරීම දුෂ්කරවෙයි. ඉපැරණිම ලේඛන සාධක පදනම් කරගෙන ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස ලාංකේය ශිලාලේඛන භාෂක සමාජයෙහි

ප්‍රාරම්භක අවස්ථාව ලෙස සලකා අධ්‍යයනය කරන කල එහි විකාශනයේ ස්වරූපය අනුව අවධි කිහිපයකට වර්ගීකරණය කළ හැකිය. ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ දෙවැනි සියවස දක්වා කාලය ලාංකේය ලේඛන සම්ප්‍රදායෙහි මෙන්ම සිංහල ශිලාලේඛනකරණයෙහිද ප්‍රාරම්භක ලක්ෂණ පළට කෙරෙන යුගයක් ලෙස හඳුනාගැනීම යෝග්‍ය වෙයි. මෙම කාල පරාසයට අයත් දැනට ශ්‍රී ලංකාවේ හමු වී ඇති සෙල්ලිපි සියල්ලම පාහේ භික්ෂූන් වහන්සේලා හා සම්බන්ධ, උන්වහන්සේලා විෂයෙහි කරන ලද ලෙන් පූජා පිළිබඳ තොරතුරු සහිතය. සිංහල භාෂාව ප්‍රාකෘත ලක්ෂණවලින් සමන්විත වීම මෙම යුගයේ ශිලාලේඛනවල භාෂා තත්ත්වය වන අතර භාෂාඥයින් සඳහන් කරන ආකාරයට ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසේ මධ්‍ය භාගය දක්වා වූ බොහෝ සෙල්ලිපි රචනා කොට ඇත්තේ ඉන්දීය අශෝක අක්ෂරවලට සමාන අක්ෂරවලිනි. එම අක්ෂර භර්හුත් හා සාංචි ස්තූපයන්හි තොරණවල අක්ෂරයන්ට ද ඇතැම් ඉන්දියානු ප්‍රාකෘත ලිපිවල අක්ෂරයන්ට ද එමෙන්ම දකුණු ඉන්දියානු බ්‍රාහ්මී ලෙන්ලිපි අක්ෂරවලට ද සමාන වෙයි (*Wikramasinghe, 1912;07*). ක්‍රිස්තු වර්ෂ තුන්වන සියවසේ සිට හත්වන සියවස දක්වා කාලය ලාංකේය ශිලාලේඛන වංශකතාවේ සන්ධිස්ථානමය කාලයක් ලෙස හඳුනාගත හැකිය. සංඛ්‍යාත්මකව විශාල අගයක් සහිත මෙකල ශිලාලේඛන සවිස්තරාත්මක හා දීර්ඝ ලේඛන වෙයි. ඓතිහාසික හා සමාජීය කරුණු රැසක් හෙළි කරන මෙකල ශිලාලේඛන පූර්ව යුගයන්ට වඩා අන්තර්ගතයෙන් හා අරමුණුවලින්ද විවිධ වෙයි. ඇළ, කුඹුරු, ගම්වර පූජාකිරීම්, ගොඩනැගිලි පිළිසකර කිරීම්, අරියවංශ පිංකම් පැවැත්වීම මෙන්ම ඉඩම් මිලදී ගැනීම්, නිති විරෝධි ප්‍රතිලාභ, රාජ්‍ය නිති, රීති හා දඩුවම් ආදිය පිළිබඳ තොරතුරු ඒ අතර ඉස්මතුව පෙනෙයි.

හත්වන සියවසින් පසුව ලාංකේය ශිලාලේඛනකරණයේ විශේෂ වර්ධනයක් නොපෙන්වන අතර මෙකල සංඛ්‍යාත්මකව අවඅගයක් සහිත ශිලාලේඛනවල භාෂාවේ විශේෂතා රැසක් විද්‍යාමාන වෙයි. ප්‍රාකෘත ලක්ෂණවලින් මිදී ස්වාධීන ලෙස හෙළ බස වැඩෙන්නට පටන්ගත් ආකාරය ඒ අතර විශේෂතාවකි. තදනන්තරව උදාවෙන නවවැනි හා දසවැනි සියවස් සිංහල ශිලාලේඛනකරණයෙහි අතිව්‍යාප්ත ස්වර්ණමය යුගය ලෙස හැඳින්වීම යුක්තියුක්ත වෙයි. මෙකල ශිලාලේඛනවලට බහුල වශයෙන් වස්තු විෂය වී ඇත්තේ සංඝ සමාජය වෙත කරන ලද විවිධ පරිත්‍යාග වන අතර ආරාමවලට ආසන්නව තිබූ විශාල ඉඩම් යායවල් සඳහා අත්තානි දීමනා සැපයීමෙහිලා තද්යුග පාලක-පාලිකාවන් අභිරුචි වූ ආකාරයද

ඉස්මතුව පෙනෙයි. එසේම දහවන සියවසේ අගභාගය පමණ වන විට වෙසෙසි ගණයට අයත් සෙල්ලිපි පෙළක් හමුවෙයි. ඒවා සංඝ සමාජය දුශ්ශීලවීමෙන් වළක්වාගනු පිණිස රජවරුන් විසින් පනවන ලද ව්‍යවස්ථා ලේඛනගතකිරීමයි. එසේම එම සෙල්ලිපි මඟින් අත්තානි ප්‍රදානය කළ භූමිවලට රාජකීය නිලධරයන්ගේ ඇතුළුවීම ද තහනම් කර ඇත (1990;07). පොළොන්නරු යුගයේදී ශිලාලේඛනකරණයේ විශාල දියුණුවක් පෙනෙන අතර එතෙක් වැඩිම ශිලාලේඛන සංඛ්‍යාවක් සඳහා අනුග්‍රහ දක්වන ලද රජු ලෙස සැලකෙන්නේ නිශ්ශංකමල්ල රජතුමායි. ක්‍රිස්තු පූර්ව තෙවන සියවසේ සිට පොළොන්නරු යුගය දක්වා සිංහල ශිලාලේඛන භාෂක සමාජයෙහි දේශපාලන-ආර්ථික හා සමාජ-සංස්කෘතික ලක්ෂණ තත්කාලීන සිංහල භාෂාවට ඍජුව බලපෑම් කර ඇති බව මෙම අධ්‍යයනයෙන් හඳුනාගත හැකිවිය. ඒ අතර පහත සඳහන් සමාජ-සංස්කෘතික තත්තව සහ ආකෘති ප්‍රමුඛ වෙයි.

- විවිධ රාජවංශිකයන්ගේ රාජ්‍ය පදවිප්‍රාප්ති හා පරිපාලන ස්වභාව
- භාරතීය දේශපාල ආක්‍රමණ, ආභාස හා බලපෑම්
- කෘෂිකර්මාන්තය, විවිධ ආර්ථික ක්‍රමෝපාය හා භාරතීයාභාස
- වාරි තාක්‍ෂණය, ඉඩම් හා බදු ප්‍රතිපත්ති
- බුදුදහම, මහායානය හා හින්දු ආගම් ප්‍රතිපදා
- ආවාහ, විවාහ, චාරිත්‍ර-වාරිත්‍ර හා භාරතීයාභාස
- පන්ති, කුල, ජනවර්ග හා භාරතීය බලපෑම

භාෂාව යනු සමාජ හා සංස්කෘතික මෙවලමකි. සමාජ-සංස්කෘතියෙන් තොර භාෂාවේ පැවැත්ම මෙන්ම භාෂාවෙන් වියුක්තව සමාජ හා සංස්කෘතික පැවැත්මත් සුස්ථිර නොවන බව සමාජවාග්විද්‍යාවේ මූලධර්මයයි. එබැවින් ප්‍රස්තුත කාලයෙහි සිංහල ශිලාලේඛන භාෂාවේ පූර්වෝක්ත දේශපාලන-ආර්ථික හා සමාජ-සංස්කෘතික සාධක තත්කාලීන වාක්කෝෂයට බලපෑම් කර ඇති බව නිර්ණය කළ හැකිය.

## 5. කෘෂිකර්මාන්තාබද්ධ වෘත්ති, පන්ති හා තත් වාක්කෝෂය

වෘත්තිය යනු අතීත ශ්‍රී ලංකාවේද සමාජ තරාතිරමේ තීරක සාධකයකි. වෘත්තිය පදනම්කොටගෙන සමාජ ධූරාවලියක් සහිත විවිධ පන්ති බිහිවෙන බවත් එම පන්ති විසින් ඕනෑම සමාජයක භාවිත භාෂාවේ පරිණාමයට මෙන්ම විවිධතා

ඇතිකිරීම සඳහා බලපාන බවත් සමාජවාග්විද්‍යාව නිගමනය කරයි. භාෂාව යනු මිනිස් මනසේ හා සමාජ-සංස්කෘතික පරිචයේ නිර්මිතයක් බැවින් ඕනෑම වෘත්තිකයෙකුගේ වෘත්තීයබද්ධ මනෝභාව හා අත්දැකීම් ස්වකීය පෞද්ගලික මෙන්ම සම-සාමාජික ප්‍රජාවේ භාෂාවට අනිවාර්ය බලපෑම් කරයි. ඒ අනුව වෘත්තීය ස්වභාවය, ප්‍රස්තාව හා පරිමිතතාව කරණකොටගෙන භාෂාවක පහත සඳහන් පරිණාම මෙන්ම විවිධතා සිදුකෙරෙයි.

- උච්චාරණ විවිධතා
- වාක්කෝෂීය අනන්‍යතා හා විවිධතා
- සම්මත හා විධිමත්/ අවිධිමත් භාවිතය
- ව්‍යාකරණ හෝ භාෂා රීත්‍යානුගමන අනන්‍යතා

ඉඳින් ඕනෑම භාෂක සමාජයක සාමාජිකයින්ගේ වෘත්තිය හා තත් භාෂාව අතර අත්‍යන්ත සම්බන්ධතාවක් පවතින බවත් එම සමාජවාග්විද්‍යාත්මක සම්බන්ධතාව භාෂාව කෙරෙහි බලපාන ආකාරයත් සමාජවාග්විද්‍යාත්මක අධ්‍යයනයකින් සනාථ කරගත හැකිය.

කෘෂිකර්මාන්තය පුරාණ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජීවනෝපාය හා ආදායම් මාර්ගය වූ බව ශිලාලේඛන ඇතුළු සෙසු මූලාශ්‍රයවලින් තහවුරු වෙයි. 'බත ලක්වැසියන්ගේ ප්‍රධාන ආහාරය වූ හෙයින් ඔවුන්ගේ ආර්ථික හා සාමාජික ජීවිතයේ පදනම වූයේ වී ගොවිතැනයි. සී සෑම සඳහා නගුල් ආදී යකඩ උපකරණ පාවිච්චියත් ඇතිව ස්ථිර ගොවි ජීවිතයක් ලංකාවේ පටන් ගන්නේ අදිම සිංහලයන් බව දැනට සොයාගෙන ඇති සාක්ෂ්‍යවලින් පෙනෙයි'(ආටිගල,1964;210). ශිෂ්ටාචාර ආරම්භක අවධිවල පටන් 'වරින්වර ඉන්දියාවෙන් පැමිණි සාංක්‍රමණික කණ්ඩායම් සහ දිවයින තුළම ජීවත් වූ ජනකොටස් අතර සංස්කෘතික සංකලනයන් ඇතිවූ බවත් විජය පුරාවෘත්තය, පණ්ඩුකාභය පුරාවෘත්තය ආදිය මගින් මෙම සංස්කෘතික සංකලනයේ ඡායාවන් දක්නට පිළිවන. මෙම කාලවල මිනිසා විසින් දිවයිනේ පරිසරය වෙනස් කෙරෙන ලද අවධියක් ලෙස හඳුන්වාදිය හැකිය. කැළෑ ගිනිතබා හේන් සකස්කිරීමත් ජලපාලන ක්‍රම තුළින් වී වගාව ආරම්භ කිරීමත් සිදුවූයේ මෙම අවධියේදීමය' (සිරිවීර,2005;48). ගංගා, වැව්, අමුණු ආදී ජලමූලාශ්‍රයන් ආශ්‍රිත ජනාවාස ව්‍යාප්ත වීම යනු ඒ ඒ යුගවල ලාංකේය කෘෂිකර්මාන්තයේ ව්‍යාප්තිය හා ස්වභාවය විශදකරන ලක්ෂණයක් ලෙස හඳුනාගත හැකිය. ක්‍රිස්තු පූර්ව තෙවන

සියවසේ සිට ලංකාවේ සෑම ප්‍රදේශයකම පාහේ ජනාවාසකරණය අතිව්‍යාප්තියකට ලක්වූ බව ශිලාලේඛන සාධක පවා සනාථකරයි.'වසභගේ වල්ලිපුරම් රන් සන්නස මගින් පෙනී යන්නේ වෙනම ඇමතියෙකු විසින් පාලනය කරන්නට තරම් පුළුල්ව විහිදී ගිය ජනාවාස සමූහයක් ක්‍රිස්තු වර්ෂ පළමුවන ශතවර්ෂයේ අවසානය වන විට යාපන අර්ධද්වීපයේ පවා වර්ධනය වී තිබූ බවයි' (2005;49). දහතුන්වන ශතවර්ෂය පමණ වන විට ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක්ම ශීඝ්‍ර ජනාවාසකරණයකට ලක්වී පැවති බවත් ඒ සෑම ප්‍රදේශයක්ම කෘෂිකර්මාන්තය පදනම් සාධකය ලෙස අවධාරණය කෙරී ඇති බවත් ශිලාලේඛන ඇතුළු සෑම ඓතිහාසික මූලාශ්‍රයකින්ම සනාථ වෙයි. කෘෂිකර්මාන්තය රජයේද ප්‍රධාන ආදායම් මාර්ගය වූ බැවින් ලාංකේය ඉතිහාසයේ සෑම පාලකයෙකුම පාහේ කෘෂිකර්මාන්තයේ දියුණුව වෙනුවෙන් විශේෂ අනුග්‍රහ දක්වීමට ප්‍රෝත්සාහී වී ඇති ආකාරය හඳුනාගත හැකිය. ශිෂ්ටාචාර ආරම්භයේ පටන්ම මෙරට විද්‍යමාන කෘෂිකර්මාන්තය කෙටිකලකින්ම ශීඝ්‍ර දියුණුවක් සහිත සෑමකෙනෙකුගේම පාහේ විශාල ආදායම් මාර්ගයක් හා ජීවනෝපාය වෘත්තියක් බවට පත්විය. එනිසාම ක්‍රිස්තු පූර්ව යුගවල පටන්ම කෘෂිකර්ම ක්ෂේත්‍රය සමග එකට සම්බන්ධ වූ විවිධ අංශ හා වෘත්තිකයින් රැසක් පිළිබඳ තොරතුරු වෙයි.

- ඉඩම් අයිතිය හා වගාක්ෂේත්‍ර
- ජල සම්පාදනය, වැව්, ගංගා හා ඇළ
- බීජ වර්ග, කෘෂි තාක්ෂණය හා මෙවලම්
- විවිධ කෘෂි නිලධාරීන් හා වෘත්තිකයින්
- කෘෂිබදු හා නීති-රීති

යථෝක්ත සියලු අංශ කෘෂිකර්ම ක්ෂේත්‍රය සමග අත්‍යන්තාබද්ධ බැවින් ඊට අදාළ වාක්කෝෂය කෘෂිවාක්කෝෂය ලෙස මෙම අධ්‍යයනයේදී අවධානයට ලක්කෙරිණි. ක්‍රිස්තු පූර්ව යුගවල පටන්ම කෘෂිකර්මාන්තය හා සම්බන්ධ ඉඩම්, කෘෂි භෝග, ජලය, තාක්ෂණය, මෙවලම්, නිලධාරීන්, වෘත්තිකයින්, බදු හා නීති-රීතිවලට අදාළ පහත පරිදි විශාල වචන සංඛ්‍යාවක් හමුවෙයි.

| | | | |
|---|---|---|---|
| අකර | අකල | අඩ | අඩි |
| අඩිකය | අඩිදර | අබර | අබුර |
| අමණ | ඉම | ඉරය | උබර |

| | | | |
|---|---|---|---|
| උයන්ගොවු | උයන්වැජෑරුම් | උයන්වැජෑරුම | උයන්කැම් |
| උදක | ඔය | ඔයබඩ | කමතකකුබර |
| කැබැලි | කීණ | කුබර | කුබරි |
| කුඩියකු | කුඩින් | කුඩි | කුඩම |
| කුට | කුටි | කුම්බුර් | කෙත් |
| කෙතපල | කෙත්අය | කෙත්කම් | |
| ගම්භාගය | ගම්ලද්දන් | ගැල්මිවුන් | ගෙරිගොන් |
| ගෙගොන් | ගම්ගොන් | ගො | ගොවිකුල |
| ගොවාස | ගොපක | ගොවක | ගොන්බද්දන් |
| ගොන | ගොණිගොන් | ගොඩමඩ | වව්වි |
| විත | නගල | ධාන්‍ය | ධන |
| දෙපෑළක් | දෙපෙත | දුබ්භික්ෂ | දිවෙල |
| දිවෙල් | දියපප | දිය | දසමුන |
| දස් | දය | දක | දකපති |
| දකඅවන | දකබක | දකබුක | දකරණීය |
| දකපහණක | දකවහනක | දකෙ | දකපෙත |
| දකබලි | දකෙත් | පීවෙල් | දිවැල් |
| තණගම | තණබුම | තිණ | තෙර් |
| දයට් | දියපප | දියවඩා | දෙකරල |
| දෙපෑළ | දෙරුවෙක් | වෙව | පත |
| පතය | පත්තුව | පමණගම | පමණිය |
| පමණු | පමුණු | පයලක් | පස් |
| පිටදඩහස | මදෙහස | අකලහස | නදීමාතික |
| පස්ලද් | පිඩරි | පිසඹුරුවත | පෙගිව |
| පෙදිව | පෙඩු | පෙතය | පෙලෙ |
| පොඩවය | බකි | බඩකරිය | බඩකරක |
| බඩගරය | බඩොර | බත්ගම | බත්ගමුන් |
| බදු | බලි | බිම් | බිලිබත් |
| බිලිසාල් | බෙත්ම | බොජක | බොජික |
| බොග | බොජියබක | මජිබක | මතෙර |
| මෙය | යටි | යටිමීගොන් | යලක් |
| යහලක් | යොතෙක් | වඩක | වඩනක |
| වතු | වතුඅස්සම් | වති | වත්කැම් |

| | | | |
|---|---|---|---|
| වනාත | වපික | වපිහමික | වපුරන |
| වෙල්වැදි | වෙල්කැමි | වෙලැයුත් | වෙල්වදාරන්නන් |
| වරිය | වෙවසර | සාලෙ | සාලි |
| සරක් | සමනා | ශශිරික | හස |
| හස්කරු | හස්කරුකැබිලියන් | හස්කරුවන් | හමු |
| හබ | හො | හොය | |

(රණවැල්ල, 2014; 1-391)

තිඹිරිවැව පර්වත ලිපිය, දෙවනගල පුවරු ලිපිය, පෙරිමියන්කුළම් ගිරිලිපිය, එප්පාවෙල පුවරු ලිපිය, විහාරගල ලිපිය, තෝනිගල ලිපිය, බසවක්කුලම පර්වත ලිපිය, කපුරුවැඩු ඔය ටැම්ලිපිය, බදුලුටැම් ලිපිය, කොණ්ඩවටවන ටැම්ලිපිය, ජේතවනාරාම පුවරු ලිපිය, මිහින්තලා පුවරු ලිපිය ඇතුළු ශිලාලේඛන ප්‍රමුඛකොටගත් විවිධ යුගවලට අයත් ශිලාලේඛනවල අන්තර්ගත පූර්වෝක්ත වචන තත්කාලීන සමාජ-සංස්කෘතික සංස්ථිතියෙහිම පිළිබිඹුවක් ලෙස සාමාජවාග්විද්‍යාත්මකව හඳුනාගත හැකිය. යථෝක්ත වචන තත් සමාජය සමග පැවති  අන්තර් සම්බන්ධතාව ආකාර කිහිපයකින් පැහැදිලි කරගැනීම අවශ්‍යවෙයි.

ශිෂ්ටාචාරයේ ආරම්භක අවධිය තරම්ම ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලාංකේය කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි පදනම ලෙස සැලකෙන්නේ ජලමූලාශයන් මූලික කොටගත් ජනාවසකරණයයි. මුල්ම ඉන්දීය සාංක්‍රමණිකයින්ගේ පටන්ම සිදුවී ඇති ජලමූලාශ්‍රය පදනම්කරගත් ජනාවාසකරණය සඳහා විවිධාංශාබද්ධ උතුරු හා දකුණු ඉන්දීය ආභාස සිදුවී ඇතිබව සුපැහැදිලි ලක්ෂණයකි. එම සමාජ-සංස්කෘතිකාභාස මෙරට කෘෂික්ෂේත්‍රයෙහි සෑම අංශයක් සඳහාම බලපා ඇති බවත් යථෝක්ත වාක්කෝෂයෙන් පිළිබිඹුවන්නේ එම සමාජවාග්විද්‍යාත්ම ස්වභාවය බවත්  මූලිකවම හඳුනාගත හැකිය. ඕදන යනු බත් සඳහා පාලි භාෂාගත වචනයයි. බත වෙනම සංස්කෘතියක් බවට පත්වූ සමාජයක් ඉන්දියාව සතුව පැවති අයුරු සුද්ධෝදන, දෝතෝධන, මිතෝදන හා අමිතෝදන යන සුප්‍රසිද්ධ රාජ්‍ය පෙළපත් නාම ආදී ඓතිහාසික තොරතුරුවලින් අනාවරණය වෙයි. සමාජ තත්ත්වය, කුලය, වෘත්තිය, රාජ්‍යත්වය, ආර්ථිකය මෙන්ම ආගමද එම සංස්කෘතිය සමග අත්‍යන්තාබද්ධ වී පැවත ඇත. ක්‍රිස්තු පූර්ව යුගවල පටන් පැවති මෙම අතිව්‍යාප්ත කෘෂි සංස්කෘතිය පශ්චාත්තන ලාංකේය සමාජ-සංස්කෘතික සංස්ථිති කෙරෙහි ඍජුව ආභාස වී ඇති

අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් තත් සමාජ-සංස්කෘතික ලක්ෂණවලට සාපේක්ෂ වාක්කෝෂයක් සහිත භාෂා භාවිතයක් සිංහල ශිලාලේඛන සමාජය සතුවිය.

| | | | |
|---|---|---|---|
| උදක | උබර | කෙතපල | කෙත්අය |
| කෙත්කම් | කෙත | කුබර | කුබරි |
| ගම්ගොන් | ගොපක | ගො | ගොවිකුල |
| ගොවාස | ගොවක | ගොණිගොන් | ධාන්‍ය |
| ධන | තණගම | තණබුම | තිණ |
| පමණ | පමුණ | ශශිරික | සාල (2014; 1-391) |

ඉහත නිදසුන්ගත වදන්වැල විසින් සනාථ කෙරෙන්නේ සමාජ සම්පර්කය කරණකොටගෙන භාෂාසංස්පර්ශය සිදුවෙන අයුරු අවධාරණය කෙරෙන සමාජවාග්විද්‍යාත්මක න්‍යායයි. 'ඉන්දීයයන් මෙරටට පැමිණි කාලයේ එහි පැවති ඉඩම් වගා පිළිවෙත්වලට සමාන ක්‍රමයක් මෙහි අනුගමනය කරන ලදැයි අනුමාන කළ හැකිය. ශ්‍රී ලාංකේය රජවරුන් විසින්ද පරිහරණය කොට ඇති කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රයෙහි දක්වෙන පරිදි රජය සතුව පැවති ඉඩම් සමහරක් එකල වගාකොට ඇත්තේ දාසයන් කම්කරුවන් හා සිරකරුවන් ලවාය. තවත් ඉඩම් ප්‍රමාණයක් අර්ධසීතිකා ක්‍රමයට හෙවත් අස්වැන්නෙන් දෙකෙන් කොටසක් බදු වශයෙන් රජයට ගෙවීමේ කොන්දේසි පිට අඳගොවීන් ලවා වගාකොට ඇත. තවත් සමහර ඉඩම් අස්වැන්නෙන් හතරෙන් පංගුවක් හෝ පහෙන් පංගුවක් රජයට ගෙවීමේ කොන්දේසිය පිට ස්වීයෝපජීවිත ක්‍රමයට හෙවත් ස්වෝත්සාහයෙන් වගාකිරීම සඳහා බදුගොවියන්ට පවරා දෙනු ලැබ ඇත' (රණවැල්ල, 2, 2003; 166). මෙසේ බීජවල පටන් කෘෂික්ෂේත්‍රාබද්ධ මානව හා භෞතික සෑම අංශයක් සඳහාම භාරතීය ආභාසය සිදුවී ඇත.

- භාරතීය ඉඩම් ප්‍රදාන විධි, තත් භාවිතය හා බදුක්‍රමවල ආභාසය
- භාරතීය වගා කන්න, බීජ වර්ග පිළිබඳ ආභාසය
- මෙවලම් හා තාක්ෂණිකාභාසය
- විවිධ කෘෂිනිලධාරීන් හා වෘත්තිකයින්
- කෘෂි සම්ප්‍රදාය, විශ්වාස හා නීති -රීති ආභාස

මෙම තත්ත්වය විසින් ලාංකේය කෘෂික්ෂේත්‍රයෙහි භූගෝලීය හා සමාජ-සංස්කෘතික අන්තර්සම්බන්ධතාවක් බිහිව ඇත. සමාජ ක්‍රියාකාරකම් මෙන්ම සමාජාර්ථික ආදී විවිධ සංස්ථිති හා භාෂාව අතර අවියෝජනීය සම්බන්ධතාවක් ගොඩනැගෙන අතර තත් සම්බන්ධතාව අන්‍යෝන්‍ය ප්‍රතිබද්ධ සේම අන්‍යෝන්‍ය බලපෑම්කාරකද වෙයි. එහි එක් ප්‍රතිඵලයක් ලෙස සමාජ-සංස්කෘතික සාධක විසින් භාෂාව පෝෂණය කෙරෙන අතර එම පෝෂණයම භාෂාවේ ස්ථිතිය හා පරිණාමයද වෙයි. අනුරාධපුර යුගයේ සිට පොළොන්නරු යුග අවසානය දක්වා මෙම ලක්ෂණ අඩුවැඩි වශයෙන් දැකගත හැකි අතර පාලි, සංස්කෘත මෙන්ම දෙමළ තත්සම හා අර්ධ තත්සම වචන බහුලව හමුවන්නේ මෙනිසාය.

| | | | |
|---|---|---|---|
| දකරණීය | තණගම | ධාන්‍ය | ධන |
| දකපහණක | පමණු | පමුණ | පිසඹුරුවත |
| බඩකරිය | බඩකරක | බිලිබත | බොජික |
| බොජක | සාල | හස | ශශිරික |
| තිණ | තණබුම | නගල | වැව |
| මෙලාට්සි | බිලිබත් | බිලිසාල් | |

(2014; 1-391)

වව, වැව, වැ, වෙව, වවි, වවිය, අවි, අවිය, වවය, විය, වපි, වාපි, අළි, ඇළ, ඇල , කුලම, හෝ, කබර, කුබර, කුඹුර, කුහර, උබර, කෙත, කෙය, ඛෙත ආදි වශයෙන් වැව, කුඹුර හා වගාක්ෂේත්‍රය හැඳින්වීම සඳහා විවිධ වචන භාවිත කර තිබීම ඒ ඒ යුගවල සිහල භාෂක සමාජයේ සමාජවාග්විද්‍යාත්මක ස්වභාවය පළට කරන්නක් ලෙස හඳුන්වාදිය හැකි අතර පහත සඳහන් තත්ත්වලක්ෂණ ඒ අතර ප්‍රමුඛතර විය හැකිය.

- තත්කාලීන වාක්කෝෂීය අල්පතාව
- ලේඛකයන්ගේ භාෂා දැනුමේ ස්වභාවය
- අන්තර්භාෂා සංස්පර්ශය හා සෘණීකරණය
- ප්‍රස්තාවබද්ධතාවෙහි ජනප්‍රියත්වය හා සුලභතාව

මීට අමතරව විශේෂයෙන් ඉස්මතුවන ලක්ෂණයක් ලෙස බෞද්ධ හා හින්දු ආගමික බලපෑම දැක්විය හැකිය. බොහෝ ජනාවාස, වැව්, ගංගා, ඇළමාර්ග නාමකරණය

මෙන්ම දේශපාලන අනුග්‍රහ දෙනලද පාලක-පාලිකා නාමකරණයද ආගමික මුහුණුවරක් ගැනීම ප්‍රබල සමාජවාග්විද්‍යාත්මක සාධකයකි.

## 6. ප්‍රතිඵල

මෙම පර්යේෂණය සමාජවාග්විද්‍යාත්මක ප්‍රවේශයකින් සිංහල ශිලාලේඛන භාෂාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ වාග්කෝෂය පිළිබඳ කරන ලද්දකි. ඒ අනුව තත්වාක්කෝෂය හා සමාජ-සංස්කෘතික අන්තර් සම්බන්ධතාව හඳුනාගැනීමේ අවස්ථාවත් ඊට අදාළ සමාජවාග්විද්‍යාත්මක සාධකවල ස්වභාවය සංක්ෂිප්ත අනාවරණය කිරීමටත් මෙමගින් හැකිවිය.

## 7. සාකච්ඡා හා සමාලෝචනය

ශිලාලේඛන යනු ප්‍රබල හා අද්විතීය මූලාශ්‍රයමය සාධක ප්‍රවර්ගයකි. එමගින් තත්විෂයාබද්ධ ඕනෑම පර්යේෂණයක නිරවද්‍යතාව, ගැඹුර මෙන්ම සුස්ථිරතාව වෙනුවෙන් ප්‍රවේශ සැලසෙයි. සිංහල ශිලාලේඛන භාෂාව පිළිබඳ විවිධ අධ්‍යයන සිදුව ඇතත් නූතන වාග්විද්‍යා න්‍යායානුසාරීව තත් විෂයක්ෂේත්‍රය පිළිබඳ ගැඹුරු පුනර්පර්යේෂණ කිරීමේ අවකාසය මෙන්ම අවශ්‍යතාවද ඇත. මේ අතර ශිලාලේඛන භාෂාව සමාජවාග්විද්‍යාධ්‍යයනවලට භාජනය කිරීම මගින් භාෂාවේ අතීත ස්වභාවය මෙන්ම එහි පරිණාමය පිළිබඳ අපූර්ව නිගමන කරා එළඹීමේ අවකාශ උදාවනු නොඅනුමානයි. මෙම ක්ෂුද්‍රාධ්‍යයනය මගින් පර්යේෂණයට ලක්වූ ශිලාලේඛනගත කෘෂිවාක්කෝෂය, තත්කාලීන සමාජ-සංස්කෘතික හා ආර්ථික-දේශපාලන සාධකවල ඍජු පිළිබිඹුවක් බව නිගමනය කළ හැකිය. ඒ ඒ යුගවල සිදු වූ අන්තර් සමාජ-සංස්කෘතික සම්පර්ක විසින් භාෂාවට කරන ලද බලපෑම මෙමගින් අනාවරණය වෙන අතර එනිසාම පාලි, සංස්කෘත හා දෙමළ තත්සම වචනවලින් සිංහල ශිලාලේඛනගත කෘෂිවාක්කෝෂය පෝෂණය වී ඇති බව සඳහන් කළ හැකිය.

## ප්‍රණාම

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආර්.එම්.ඩබ්. රාජපක්ෂ මහතා හා මහාචාර්ය ඒ.අයි. දිවාකර මහත්මිය මෙන්ම දත්ත සම්පාදනයෙහිලා දායක වූ මූලාශ්‍රය නාමාලියේ හිමිකාර සියලු වියතුන් වෙනුවෙන් කෘතඥතාව.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය


ආටිගල,නිකලස්, (1964)" *ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය*,විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ප්‍රකාශන.

අමරවංශ හිමි, කොත්මලේ. (1969), *ලක්දිව සෙල්ලිපි,* ගුණසේන සහ සමාගම.

රණවැල්ල,සිරිමල්, (2004), *සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය,* ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

රණවැල්ල,සිරිමල් (2003), *අනුරාධපුර යුගයේ ආර්ථික රටාව,* (සංස්)ශ්‍රී ලංකාවේ ඉතිහාසය,අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේනතුව.

Peter Trudgill, (2000), *Sociolinguistic, An Introduction to Language and Society*,Penguin Books.

David Crystal, (2008), *A Dictionary of Linguistics,and Phonetics,* Blackwell publication.

R.A.Hudson, (2001), *Sociolinguistics*, Cambridge University press.

Gumperz JJ, (1971), *Language in Social Groups*,Stamford University press.

*Epigraphia Zeylanica* (1933), *Vol.-2*, Ed.Don Martino De SilvaWikramasinge, Oxford university press.

*Epigraphia Zeylanica* (1912), *Vol.-I,* Ed. Don Martino De SilvaWikramasinge, Oxford university press.

*Inscriptions of Ceylon* (1970), *Vol1 I, Ed.Paranavithana,senarath, Colombo, Government press.*

*Inscriptions of Ceylon* (1983), *Vol 2,*Ed.Paranavithana, Senarath, Colombo, Government press.